17

# විසුද්ධි මාර්ගයෙහි චරිත විග්‍රහය

පහලගම ධම්මික හිමි

පුද්ගලයාගේ මානසික ස්වභාවය මත චරිතය විවරණය වෙයි. එකී චරිත ස්වභාවය තුළින් ලෞකික හා ලෝකෝත්තර සුඛය අත් කර ගත හැකිය. සසර නිවෘත්තිය සඳහා භාවනා කිරීම බුද්ධෝපදේශයයි. භාවනා කිරීමේ දී යෝගාවචරයාට චරිතානුකූලව කමටහන් දීම සුදුසු පිළිවෙතයි. බුදු දහමට අනුව සෑම පුද්ගලයකුටම එකම ක්‍රමයකට භාවනා නූගන්වයි. විවිධ චරිත ලක්ෂණ තිබෙන පුද්ගලයන් සිටින හෙයින් එකී පුද්ගල චරිතයන්ට ගැළපෙන ආකාරයෙන් භාවනාරම්මණ නියම කොට තිබේ. පෙර භවයෙන් වත්මන් භවයට එන වාසනා ගුණ නිසා පුද්ගල වේමත්තතාව ඇති වී තිබේ. ඔවුනොවුන්ගේ සන්තානගත උපක්ලේශ අඩු වැඩි වීම නිසා ගති ලක්ෂණ විවිධ වෙයි. සමහරෙක් නිර්ලෝභී වන අතර, තවෙකෙක් ලෝභී වෙයි. තවෙකෙක් මානාධික වන අතර, තවෙකෙක් නිහතමානී වේ. තවකෙකු සතුව සොරකම, බොරුව, වංචාව, කේලාම් කීම, පරුෂ වචනය, කුහකකම තිබෙන අතර, තවකෙකු එකී චර්යාවන් බැහැර කොට ඇත. පුද්ගලයාගේ වාසනා ගුණවල අඩු වැඩි බව නිසා සසර දීර්ඝ කාලයක් නරක ක්‍රියාවල යෙදුණු අයගේ වත්මන් භවය තුළ නරක ක්‍රියාවෙහි ආශක්ත වීම දක්නට ලැබේ. සසර හොඳ ක්‍රියාවෙහි යෙදුණහු නිතර හොඳ ක්‍රියාවන් සිදු කරති. නරක දෑ කෙරෙහි ලැජ්ජා බිය සහිතව ක්‍රියා කරති. පුද්ගල චරිතවල විෂමතා හේතුවෙන් භාවනා ආරම්මණ දීමේ දී චරිත විශ්ලේෂණය කොට හඳුනා ගත යුතුය. එහි දී හමු වන්නේ පැතලි චරිත නොව සංකීර්ණ පුද්ගල චරිතයන්ය. සුපැහැදිලි චරිත ලක්ෂණවලින් යුත් චරිත හයක් මුල් කර ගෙන චරිත රාශියක් හමුවෙයි. පුද්ගල චරිත බෙදා දැක්වීම විසුද්ධිමග්ගය කම්මට්ඨානග හණ නිද්දේසයේ හමුවෙයි.

1. රාග චරිත

2. දෝ්ස චරිත
3. මෝහ චරිත
4. සද්ධා චරිත
5. බුද්ධි චරිත
6. විතක්ක චරිත[1]

සංකීර්ණ වූ පුද්ගල චරිතවල ස්වභාවය ඔවුනොවුන්ගේ චරිතානුකූලව වර්ග කළ ද එහි ප්‍රධාන ලක්ෂණ හා මිශ්‍ර ලක්ෂණ බොහෝ විට ඉස්මතු වන අවස්ථා දක්නට ලැබේ. මෙම චරිතවල තිබෙන චිත්තවේගී ලක්ෂණ හඳුනා ගෙන ඒ ඒ චරිත පාලනය සඳහා සුදුසු කර්මස්ථාන තිබේ. චිත්තවේග පුද්ගල චරිත තුළ මිශ්‍රව ඇති හෙයින් විමුක්තිමග්ගයේ දී චරිත දාහතරක් දක්නට ලැබේ. රාග චරිත, ද්වේශ චරිත, මෝහ චරිත, ශ්‍රද්ධා චරිත, බුද්ධි චරිත, විතර්ක චරිත, රාගද්වේශ චරිත, රාගමෝහ චරිත, ද්වේශමෝහ චරිත, රාගද්වේශමෝහ චරිත, ශ්‍රද්ධාබුද්ධි චරිත, ශ්‍රද්ධාවිතර්ක චරිත, බුද්ධිවිතර්ක චරිත, ශ්‍රද්ධාබුද්ධිවිතර්ක චරිත[2] මෙම චරිතවල පවත්නා මිශ්‍ර චරිත ස්වභාවයන් පිළිබඳ නොසිතා ප්‍රධාන චරිත ලක්ෂණ දෙස බැලූ විට විමුක්තිමග්ගය ද චරිත හතක් ලුහු කොට දක්වයි. විසුද්ධිමග්ගයේ දී චරිත හයත් ඊට අමතර "මිස්සක චරිත" යනුවෙන් චිත්තවේග මිශ්‍රිත චරිත ලෙස තණ්හා, මාන හා දිට්ඨි වශයෙන් චරිත කීපයක් හමුවෙයි. මෙම පුද්ගල චරිත පාලනය සඳහා ඔවුනොවුන් සතු ලක්ෂණවලට සුදුසු වූ කර්මස්ථාන ඉතාම වැදගත් වෙයි.

රාග චරිතය සතු පුද්ගලයාගේ ප්‍රධාන ලක්ෂණය වන්නේ රාගාධික වීමයි. ඔහුගේ චර්යා ලක්ෂණවලින් ඒ බව පෙනෙයි. "රාගය මූලික වූ අරමුණෙහි වාසය කරයි."[3] රාගය මූලික වූ අරමුණෙහි ඇලී වාසය කිරීම රාග චරිතයේ දී ප්‍රකටව පෙනෙන ලක්ෂණයක් වශයෙන් හඳුනා ගැනීමට පුළුවනි. රාග චරිතයක් තිබෙන පුද්ගලයා මිහිරි ආහාර ප්‍රිය කරයි. සිත් ඇද ගන්නා

---

1 ඉදානි අත්තනෝ චරියාකුලන්ති එත්ථ චරියානි ඡ චරියා රාගචරියා දෝසචරියා මෝහචරියා සද්ධාචරියා බුද්ධි චරියා විතක්කචරියාති, විමු, කර්මස්ථාන ග්‍රහණ නිර්දේශය, 242 පිටුව.

2 විම, චරියා විභාගය, 11 පිටුව.

3 එත්ථ රජනවසේන ආරම්මණවසේන චරණං ඒතස්ස අත්ථීති රාගචරණං, සද්ධ, 272 පිටුව.

පරිසරයක් තුළ ජීවත් වීමට ආශාව ඔහු සතු වෙයි. රාග චරිතය පාලනය සඳහා සුදුසු පරිසරය හා අරමුණු වන්නේ, "අපිරිසිදු ස්ථාන මතු මහල් නොමැති, බිත්තිවල සිතුවම් නොමැති ස්ථාන හා තණ කොළවලින් කළ අසුන්, පන්සල් හා ඉරියව් වශයෙන් පර්යංකය, සක්මන හා අරමුණු වශයෙන් දස අසුභ, කායගතා සතිය, නීල කසිණය, මෛත්‍රී කර්මස්ථාන සුදුසුය."[4] ද්වේශ චරිත ලක්ෂණ හිමි වන්නේ පූර්ව භවයේ දී කළ කෝලාහල බහුල වශයෙන් සිදු කිරීමේ ප්‍රතිඵල වශයෙන් වත්මන් භවයේ ද්වේශ චරිත ලක්ෂණ ඉස්මතු වෙයි. ඔහු නිතර ද්වේශයෙන් සිටී, සියුම් දෙයෙහි පවා ද්වේශාග්නිය ඇවිලී කෝපාවිෂ්ඨව කටයුතු කරයි. ද්වේශ චරිතයේ ලක්ෂණ වන්නේ ද්වේශාධික වීමයි. ඉරියව් විෂමය. පාලනය සඳහා සුදුසු ස්ථාන හා ඉරියව් මෙන් ම අරමුණු වන්නේ, "උස් නොවූ ද මිටි නොවූ ක්‍රමානුකූලව සැකසූ ස්ථාන, සිත් ගන්නා දේ ඉරියව් වශයෙන් නිදා ගැනීමත්, හිඳ ගැනීමත්, සුදුසු වෙයි. අරමුණු වශයෙන් නීල, පීත, ලෝහිත හා ඕදාත යන වර්ණ කසින හා සතර බ්‍රහ්ම විහාර සුදුසුය."[5] ද්වේශ චරිතය සතු පුද්ගලයා නිරන්තරයෙන්ම "ද්වේශ සහගත අරමුණුවල හා චර්යාවන්වල යෙදේ."[6] ආහාර පාන ගැනීමේ රූක්ෂ වූ කටුක ආහාර ප්‍රිය කරයි. පූර්ව භවවල බහුල වශයෙන් මත්ද්‍රව්‍ය පාවිච්ච කිරීම හා ධර්ම ශාස්ත්‍ර උද්ග්‍රහණය නොකිරීමේ ප්‍රතිඵල වශයෙන් වත්මන් භවයේ දී මෝහ චරිත ලක්ෂණ ඉස්මතු වෙයි. ගමන් කරන විට එහි අපිළිවෙළ දක්නට ලැබේ. නොසන්සුන්ය. ස්ථිරසාර අරමුණක් නොමැත. අන්‍යයන්ගේ අරමුණුවල එල්බ ගනී. අලසකම නිතර පවතී. සැකයෙන් හා

---

4 කිං චරිතස්ස පුග්ගලස්ස කිං සප්පායන්ති, එත්ථ පන සේනාසනං තාව රාග චරිතස්ස අධොතවේදිතං භූම්මට්ඨාකං අකට්ඨපබ්බහාරං තිණකුටිපණ්ණසාලාදීනං අඤ්ඤතරං රජොකිණ්ණං ජතුකාහරිතං ඕලුග්ගවිලුග්ගං අතිඋච්චං වා අතිනීලං වා උජ්ජංගලං... ඨානං වා චංකමෝ වා වට්ටති ආරම්මණං නීලදීසු වණ්ණකසිනේසු යං කිඤ්චි අපරිසුද්ධවණ්ණන්ති ඉදං රාග චරිතස්ස සප්පායං, විම, 259, 261 පිටු.

5 දෝසචරිතස්ස සෙනාසනං නාති උච්චං ඡායූදකං සම්පන්නං සුවිභත්තං භිත්තිත්ථම්භසෝපානං සුපරිනිට්ඨං මාලාකම්මං ලතාකම්මං නානාවිධචිත්තකම්මසමුජ්ජලං සමනිද්ධමුදුභූමිතලං බ්‍රහ්මවිමානමිව කුසුමදාම විචිත්‍රවණ්ණං... ඉරියාපථෝපිස්ස සෙයයා වා නිසජ්ජා වා වට්ටති. ආරම්මණණං නීලාදිසු වණ්ණකසිණේසු යං කිඤ්චි සුපරිසුද්ධවණ්ණන්ති ඉදං දෝස චරිතස්ස සප්පායං, එම, 263 පිටුව.

6 දුස්සන වසේන ආරම්මණේ චරණං ඒතස්ස අත්ථීති දෝස චරිතෝ, සද්ධ, 272 පිටුව.

මිථ්‍යාවෙන් ජීවත් වීම මෝහ චරිතයේ පොදු සුලක්ෂණ වෙයි. මොහුගේ චරිත පාලනය සඳහා සුදුසු ස්ථාන මෙන් ම ඉරියව් හා අරමුණු වන්නේ "විවෘත ස්ථාන, ඉරියව් වශයෙන් සක්මන් කිරීම අරමුණු වශයෙන් ආනාපානසතිය සුදුසු වෙයි."[7] මෝහ චරිතයා නිරන්තරයෙන් "මුලා වීම් බහුලව අරමුණුවල තැති ගෙන හැසිරෙයි."[8] ඔහු මුග්ධ ස්වභාවයෙන් කටයුතු කරයි. ශ්‍රද්ධා චරිතය සතු පුද්ගලයා ශ්‍රද්ධාධිකය. "රාග චරිතයට හිමි ලක්ෂණ මොහු සතු වෙයි."[9] බුද්ධානුස්සතිය වැඩීම සුදුසු වෙයි. ශ්‍රද්ධා චරිතය නිරන්තරයෙන් "අධික වූ විශ්වාසයෙන් යුතුව වාසය කරයි."[10] එමෙන් තෙරුවන කෙරෙහි ඇලුම් කරයි. දීමට කැමතිය. බුද්ධි චරිත සතු පුද්ගලයාගේ නුවණ අධිකය. මොහු ආහාරයේ ප්‍රමාණය දැන ආහාර ගනී. සතියෙන් යුක්තව කටයුතු කරයි. ද්වේශ චරිතයට කියූ ලක්ෂණ බුද්ධි චරිතය සතු වෙයි. "කුමන ස්ථානයක් වුවත් බුද්ධි චරිතයට ගැළපේ."[11] බුද්ධි චරිතය "නුවණාධික වීම නිසා ම ඤාණ චරිත යනුවෙන් හඳුන්වයි."[12] නුවණ මුල් කොට කටයුතු කරන නිසා ඔහුට සුදුසු වන්නේ මරණසති, උපසමානුස්සති, චතුධාතුවවත්තාන හා ආහාරෙ පටික්කුලසංඥා ආදී කර්මස්ථානයන්ය. විතක්ත චරිත සතු පුද්ගලයාට ස්ථිර ක්‍රියාවක යෙදීම අපහසුය. ඔහුට "විවෘත ස්ථාන, ආරාම, වන, පොකුණු, ගම්, නියම්ගම්, ජනපද සුදුසු නොවේ, ගිරි, ගුහා ස්ථාන වශයෙන් ද අරමුණු වශයෙන් විශාල අරමුණු සුදුසු නොවේ."[13] විතක්ක චරිතය "විතර්කනය, රැස් කිරීම

---

7 මෝහචරිතස්ස සේනාසනං දිසාමුඛං අසම්බාධං වට්ටති, යත්ථ නිසින්නස්ස විවටා දිසා පඤ්ඤත්ති ඉරියාපතේසු චංකමෝ වට්ටති, එම, 272 පිටුව.

8 මුහ්හනවසේන ආරම්මණේ චරණං ඒතස්ස අත්ථීති මෝහ චරිතෝ, සද්ධ, 272 පිටුව.

9 සද්ධාචරිතස්ස සබ්බම්පි දොසචරිතම්පි වුත්තවිධානං සප්පායං, ආරම්මණේසු චස්ස අනුස්සතිට්ඨානම්පි වට්ටති, විම, 264 පිටුව.

10 ඕකප්පව සද්ධාවසේන ආරම්මණේ චරණං ඒතස්ස අත්ථීති සද්ධා චරිතෝ, සද්ධා, 272 පිටුව.

11 බුද්ධිචරිතස්ස සේනාසනාදීසු ඉදං නාම අසම්පායන්ති නත්ථී, විම, 264 පිටුව.

12 ඤාණමේව චරණං ඤාණේ වා චරණං ඤාතතෝ ඤාණස්ස වා ඒතස්ස අත්ථීති ඤාණ චරිතෝ, එම

13 විතක්කචරිතස්ස සේනාසනං විවටං දිසාමුඛං යත්ථ නිසින්නස්ස ආරාම වන පොක්ඛරණීරමණෙයයකානි ගාම නිගාම ජනපදපටිපාටියෝ නීලෝභාසා ච පබ්බතා පඤ්ඤායන්ති තං න වට්ටති... ආරාම්මණේ විපුලං න වට්ටති, එම, 264 පිටුව.

හා කල්පනා කිරීම මුල් කොට වාසය කරයි."[14] මෙම සයාකාර වූ පුද්ගල චරිත විශ්ලේෂණයෙන් ඔවුනොවුන්ගේ ජීවන ස්වභාවය මත පිහිටා චරිත විභේදනය සිදු කොට තිබෙන බව පෙනේ. සෑම චරිතයක් ම පාලනය සඳහා භාවනා වැඩීමට සුදුසු ස්ථාන, ඉරියව් හා අරමුණු නිවැරදි ලෙස හඳුනා ගැනීම සුවිශේෂ වෙයි. මානව සමාජය මෙසේ හඳුනා ගෙන පුද්ගල චරිත හයකට වෙන් කර එකී චරිතවල කැපී පෙනෙන මූලික ලක්ෂණ තුළින් චිත්තවේග පාලනය කළ හැකිය. එකී පාලනයට මාර්ගය වන්නේ ද පුද්ගල චරිත විශ්ලේෂණයයි.

14 විතක්කනවසේන ඌහනවසේන ආරම්මණේ චරණං ඒතස්ස අත්ථීති විතක්ක චරිතෝ, සද්ධ, 272 පිටුව.